ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2012 ඔක්තෝබර් 29 සඳුදා
05 වෙළුම - 02 කලඹ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00





## සියලු සාන්තුවරයින්ගේ මංගල්‍යය

### නොවැම්බර් මස 01 වන දා

**ළමා අපේ ජීවිතවලටත් සාන්තුවර ජීවන චරිතයන්**
**ජීවිත ආදර්ශයක් කරගනිමු !**

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# සියලු සාන්තුවර මංගල්ලෙන් පුංචි දිවි මඟට ආදර්ශයක්

## ආදරණීය දුවේ පුතේ...

නොවැම්බර් මස 01 වැනිද ලොව පුරා කතෝලික සභාව සියලු සාන්තුවරයන්ගේ මංගල්ලය සමරනු ලබනවා. සියලු සාන්තුවර මංගල්ලය අන් කාටත් වඩා දූලා පුතාලට රසවත් අත්දැකීමක්. එද අපේ ගමේ ගොඩේ සියලු සාන්තුවර මංගල්ලෙට පුංචි දූ දරුවන් එක් රැස්කර රසකැවිලි දනයක් දුන්නා.

පුංචි දූ දරුවන් සාන්තුවරයන් මෙන් ශුද්ධවන්ත නිසා මේ සිරිත පවතින බව අතීත පුරාවත සොයා බලද්දී පෙනී යනවා. ඒ වගේම මළවුන්ගේ මංගල්ලෙ යෙදෙන නොවැම්බර් 02 දට කලින් දවසේ කතෝලික ජන වන්දනා ලිත සියළු සාන්තුවරයන්ටයි වෙන්කර තිබෙන්නේ.

සියලු සාන්තුවර මංගල්ලයේ ආරම්භය සනිටුහන් වන්නේ මැද පෙරදිග සිරියාවෙනි පස්වන සියවසේදී පෙන්තකෝස්ත ඉරුදිනට පසුව එළැඹි ඉරිද සියලු සාන්තුවර මංගල්ලය පවත්වන්නට පෙරදිග ඕතඩොක්ස් සභාවන් පියවර ගෙන තිබුණා. ක්‍රිස්තු වර්ෂ 610 මැයි 13 වැනිද අති උත්තම සිව්වැනි බොනිපස් ශුද්ධෝත්තම පියතුමා සියලු සාන්තුවර මංගල්ලය රෝමයට රැගෙන ආ බව කියනවා.

විවිධ දෙවි දේවතාවුන්ට කැපකර තිබූ මිථ්‍යා දෘෂ්ටිකයන්ගේ දේවාලයක් දෙව්මැදුරක් බවට පරිවර්තනය කරමින් දේව මාතාවන් පෙරටු කරගෙන විවිධ සාන්තුවරයන්ගේ ශුද්ධවූ ධාතු තැන්පත් කර නමවැනි සියවස දක්වා එහි සියලු සාන්තුවර මංගල්‍යය පැවැත්වූ බව ඉතිහාසයේ දැක්වෙනවා.

ක්‍රිස්තු වර්ෂ 835 දී ප්‍රංශ අධිරාජයාවූ ලූයිස් ද පයස්ගේ ඉල්ලීමක් අනුව එවකට සසුන් පියාවූ අති උත්තම සිව්වැනි ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා සියලු සාන්තුවර මංගල්‍යය නොවැම්බර් 01 ද පැවැත්වීමට නියම කළා.

සියලු සාන්තුවර මංගල දිනයේ සුවිශේෂී වටිනාකම නම් සාන්තුවර බව දිනාගත් දෙවියන් වහන්සේට අති ප්‍රසන්න නිල සාන්තුවර සාන්තුවරියන් සමගින් එවන් නිල සාන්තුවරයට වරම් නොලැබුවද සාන්තුවර දිවියක් ගත කර සදකාල ජීවිතය දිනාගත් සෑම සියලුදෙනා සිහිපත් කිරීමයි. එහිදී දුවේ පුතේ මේ මංගල්ල දිනය අපට ඇරියුම් කරන්නේ කුඩා කාලයේ පටන් දේව කැමැත්තට හිසනමා ඉතා පිරිසිදු අවංක ජීවිතයක් ගත කරන්නටයි.

රෝමානු කතෝලික සභාව එද පටන් අද දක්වා මේ දිනය මහත් භක්තියෙන් සහ හරසරින් සමරනවා. කතෝලිකයන් බහුතරයක් වෙසෙන බටහිර රටවල්වල මේ දිනය නිවාඩු දිනයක් ලෙස නම්කර තිබෙනවා.

දුවේ පුතේ ! සියලු සාන්තුවර මංගල්ලයෙන් අපට ලබාගත හැකි ආදර්ශයන් රැසක් තිබෙනවා. ළමා වියේ දිවි ගෙවන ඔබද පුංචි සාන්තුවරයකු සාන්තුවරියක බව සිහි තබාගන්න. මේ දේව තිළිණය මගින් ඔබේ ජීවිතය ආලෝකවත් කරගෙන ඉදිරියට පිය මනිද්දී ඔබේ ජීවිතයේ ආදර්ශනය බවට මේ සාන්තුවර සාන්තුවරියන් සමීප කර ගන්න. ඒ ඔස්සේ අනාගත දිවි මඟ සාර්ථක කරගන්න පුංචි දූ පුතුන්ට එය ආශිර්වාදයක් සමගින් වාසනාවක්ම වේවා!

**ඔබ සැමට ජේසු පිහිටයි !**

**ශිරාන් මෛත්‍රී**
ඥානාර්ථ ප්‍රදීපය සහකාර සංස්කාරක

# පෘතුගීසීන් මෙරට දේශපාලනයට කැඳවීම

තම සොහොයුරාගේ අසීමිත අපේක්ෂාව කෝට්ටේ රජකම ලබා ගැනීම වූ නිසා ඔහුගේ ආරක්ෂාව පතා පෘතුගීසීන් වෙත හැරුණු බුවනෙකබාහු රජ තුමාට තවත් ප්‍රශ්නයක් විය. ඒ තමන්ගෙන් පසු කෝට්ටේ රජකම පවරා දෙන්නට පුත් කුමරකු නැති වීම යි.




බුවනෙකබාහු රජුට සිටියේ දියණියකි. සමුද්‍රදේවී නම් වූ ඈ විවාහ වූ වීදිය බණ්ඩාර ද දක්ෂ මෙන්ම දරුණු සටන් කාමියෙකි. හෙතම තම දියණියන් මරා දැමූ බව විශ්වාස කළ බුවනෙකබාහු රජතුමා ඔහු කෙරෙහි කිසිසේත් බලාපොරොත්තු නොතැබුවේ ය. මේ හේතුවෙන් රජතුමා අවසානකොට තම අනුප්‍රාප්තිකයා ලෙස තෝරා නියමකැර ගත්තේ තම අට වියේ සිටි මුනුබුරා වූ ධර්මපාල කුමරාය.

මේ අනුව ධර්මපාල කුමරුට පෘතුගීසි අනුමැතියත් රැකවරණය සහ සහයෝගයත් ලබා දෙනු පිණිස පෘතුගාලයේ රජු විසින් ම ඔහුට ඔටුනු පැළැඳවීමේ උපායක් සැලසුම් කළේ ය. ඒ අනුව රිදීයෙන් තනන ලද ධර්මපාල කුමරාගේ පිළිරුවක් සමග රාජකීය දූත පිරිසක් ක්‍රි.ව. 1542 දී පෘතුගාලයට යැව්වේ ය. පුරෝහිත රාළ හෙවත් සල්ලප්පු ආරච්චි නමැති බ්‍රහ්මණයකු ගේ නායකත්වයෙන් මේ පිරිස යවන ලදි. පෘතුගීසි බස හොඳින් දැන සිටි මොහු ග්‍රන්ථ අක්ෂරයෙන් අත්සන් තබා ඇති හෙයින් ඔහුගේ නම ශ්‍රී රාමාරක්ස යනුවෙන් සටහන් විය යුතු යැයි මහාචාර්ය සෙනරත් පරණවිතාණයන් සඳහන් කර ඇත.
(මේ සඳහා වීටෝ පර්නියෝලා - ද කැතලික් චර්ච් ඉන් ශ්‍රී ලංකා '' පෘතුගීසී යුගය 1 වෙළුම 15 පිටුව බලන්න )

මෙම නියෝජිත පිරිස ලිස්බන් නුවරට සැපත් වූයේ 1542 සැප්තැම්බර් මස දී පමණය. මොවුහු ධර්මපාල කුමරා ගේ රිදී පිළිරුව මෙන් ම ඇත් දළින් කැටයම් කරන ලද බුවනෙකබාහු රජතුමාගේ ප්‍රතිමාවක් ද ගෙන ගියෝ ය.
(ඉහත සඳහන් ග්‍රන්ථයේ 22 වැනි පිටුව)

මෙම නියෝජිත පිරිස එහි ගියේ ධර්මපාල සංකේතවත් ලෙස ඔටුනු පළඳවා ගැනීමට ය. එහි දී පෘතුගීසීහු. සියුම් පරීක්ෂණයක් කොට ධර්මපාල කුමරුට රජ අයිතිය ඇති බව සනාථ වූ පසු එම පිළිරුවට ඔටුනු පැළඳුවෝ ය. මෙය කරන ලද්දේ 3 වැනි ජුවාම් පෘතුගීසි රජු විසිනි.

මේ නියෝජිත පිරිස මගින් බුවනෙකබාහු රජ තුමා පෘතුගීසීනට දන්වා සිටි කාරණා රැසකි. ප්‍රථමයෙන් තම මුනුබුරාට ඔටුනු පළඳවා ඔහු තම අනුප්‍රාප්තිකයා ලෙස පිළිග න්නා ලෙස යි. දෙවැනිව කතෝලික පූජකවරු ධර්මදූත කටයුතු සඳහා මෙහි එවන ලෙසයි. තුන් වැනිව එම පියතුමන්ලාට තම රාජධානිය තුළ දහම ප්‍රචාරය කිරීම සඳහා පූර්ණ අවසරය දෙන බව යි. තවද තමා ද කිතු දහම කෙරෙහි පැහැදී සිටින බව යි. මේ අනුව කිතු දහම ප්‍රචාරය කරනු වස් පෘතුගීසි ධර්මදූතවරුන් මෙහි පැමිණ ඇත්තේ රාජ්‍ය ආරාධනයෙන් බව කීම අසත්‍යයක් නොවේ.

සෙසු කාර්යයන් කෙසේ වෙතත් ධර්මදූතවරුන් සම්බන්ධයෙන් නම් රජ තුමා අවංක නොවීය. මෙහි වැඩමකළ පූජකවරුනට රජු හමුවීම පවා ඉතා දුෂ්කර කාරියක් විය.

''පනින රිලවුනට ඉනිමං තැබීම '' වැනි බුවනෙක බාහු ගේ මෙම ක්‍රියාව පෘතුගීසිනට මේ රටේ දේශපාලනයට අත ගැසීමේ අවසරය නිල වශයෙන් විවෘත කැර දුනි.

ක්‍රි.ව. 1551 දී ඇන්ටෝනියෝ ද බාර්සෙල්ලෝස් නමැති පෘතුගීසි යුද සෙබළා ගේ තුවක්කුවෙන් ''වැරදීමකින්'' නික්මුණු වෙඩි උණ්ඩයක් වැදී බුවනෙකබාහු මිය ගියේ ය. මෙය සිදු වී ඇත්තේ බුවනෙකබාහු රජතුමන් කැලණි ගඟ අද්දර පිහිටි තම වනවාසලේ සඳැල්ලට වී උදැසනක සිටිය දීය. මෙය මායාදුන්නේ රජු විසින් කරවන ලද්දක් බව ද වාර්තා වේ. හෙතෙම මෙම පෘතුගීසි සෙබළා ලවා එය කළ බව වියත් ඉතිහාසඥ එස්.ජී. පෙරේරා පියතුමා ''ඒ හිස්ට්‍රි ඔෆ් සිලෝන් '' නමැති ග්‍රන්ථයේ පිටු 33-34,46 යන පිටුවල සඳහන් කරයි.

කෙසේ වෙතත් බුවනෙකබාහු පිළිබඳ ''රාජාවලිය '' මෙසේ සටහන් කැර ඇත.'' මෙම අඥාණ ක්‍රියාව නිසා පෘතුගීසීහු රජුට විපත කළෝය. පසු පරම්පරාව පාත්‍රවූ අයුක්තියට හා අසාධාරණයට ද බුවනෙකබාහු රජතුමා වගකිව යුතුයි. ඉන් ඉක්බිති බුදු දහමට සිදු වූ හානිය ගැන ද වගකිව යුතුයි'' (රාජාවලිය - ඒ වී සුරවීර - ප්‍රථම මුද්‍රණය 1976, 219 පිටුව බලන්න.)




ළමා ප්‍රදීපය හා බැඳෙන

## ළමා ක්‍රියාකාරි වීරයෝ

## මම තනියෙන් අම්මේ

තනිකම පාළුව හුරු පුරුදුයි දැන්
ඔබ නැති ලෝකය අඳුරුයි දැන්
එදා සිටිය කිසිවකු අද නැත
සෙනෙහසින් මා අමතන්නට

කඳුළු වුනත් දැන් හරි යාළුයි
දුක තනිකම මගේමයි දැන්
කෙලෙස වුවත් ඔබ නැති පාළුව
මකාදමන්නට නොමැත අයෙක්
අද මේ ලොව තුළ මව්නි දයාබර

**මධුෂා නිල්මිණී**
නිර්මාණ හවුල
ලංසිගම ඒකකය



## වඳිනෙමි සැමදා

ලේ කිරි කරලා මට පෙව්වා
ආදරයෙන් නිරතුරු සැළකුවා
දුවේ කියා මා හැම විට ඇමතුවා
මගේ ආදර සුදු අම්මා

ලෙඩට දුකට මා ළඟින් විය
ආදරයෙන් මා නැළවිය
ගෙදර බුදුන් ඔබම විය
වඳිනෙමි  සැමදා ඔබ පායුග

**ඉෂාරා දිල්හානි**
බුත්තල ඒකකය

## සුරකිමු ජලය පණ සේ



මිනිසාටත් , සතුන්ටත්, ගස්වැල් වලටත්, නිතර ජලය අවශ්‍ය වේ. ජලය නොමැති වුවහොත් මිනිසාටත්, සතුන්ටත්, ජීවත් විය නොහැක. නමුත් ගස්වැල් විනාශ කිරීම නිසා ජලය විනාශ වේ. එලෙසම ජලය අරපිරිමැස්මෙන් යුතුව ප්‍රයෝජනයට ගත යුතුය. වර්ෂාව මගින් ලැබෙන ජලය ආරක්‍ෂා කරගත යුතුය. ගස් කැපීමෙන් වර්ෂාව අඩු වේ. එවිට ගංගා, ඇළ දොළ සිඳී යයි. එමගින් විදුලිය නිපදවීමට ද අපහසුතා ඇති වේ. එබැවින් ජල සම්පත රැක ගනිමින් සුන්දර පරිසරයද ආරක්‍ෂා කරගනිමු.

**විහංගි මධුකලා**
සිදුපියනිල - බණ්ඩාරවෙල

## මල් වාගෙයි පුංචි අපි



පුංචි ළමයි මල් වාගෙයි . ඔවුන්ගේ හදවත් හරිම ලස්සනයි. මේ පුංචි මල් කැකුළු තමයි මේ රටේ අනාගතය භාර ගැනීමට සූදානම්ව සිටින්නේ. එහෙත් අද විෂමකාරී සමාජයක සිටින සමහර වැඩිහිටියන් තමන්ගේ දරුවන්ට වඩා මුදල් අගය කරති. එබැවින් මිරිඟුවක් පසුපස දිවයන මුව පැටවුන් මෙන් කාලය ගත කරති. මේ සියලු තත්ත්වයන් යටතේ හංසයා දියෙන් කිරි වෙන් කර ගන්නාසේ හොඳ නරක මිශ්‍ර වී ඇති සමාජය තුළින් හොඳ පමණක් තෝරාගෙන ළමා පරපුර ආරක්‍ෂා කර ගත යුතුයි. ඔවුන්ට ඔවුන්ගේ ළමා ලෝකය උරුම කර දිය යුතුයි. එමෙන්ම මේ මිහිතලය මත දෙපයින් නැගී සිට පුංචි අපේ ලෝකය තවත් ලස්සන කර ගැනීමට අපි කැපවෙමු.

**මධූෂා ප්‍රබෝධනි**
කමරාගොඩ

# සමනළ අසපුව

**ජේසු පිහිටයි අම්මා පුංචි සමනලි අම්මාගේ දෙපා නමැද දහම් පාසල් යන්න ලෑස්ති වෙනවා. ...උෟයි අම්මෝ පුංචි කටහඬ පරදවා, හොර වැඩමයි කරන්නේ කැඩුව නේද අපූරු පිඟාන. මම අද ඉතුරු කරන්නෑ උඹව .... බැණුම් කෝච්චියක් නේ. සමනලී අයියලා හිතන විදිහට හිතුවා. සමනලීගේ අල්ලපු ගෙදර වැඩට ඉන්න අයෝමි ගැන සමනලීට හරිම දුකයි. එයාව ඉස්කෝලේ අරින්නේ නෑ. ගෙදර තියෙන වැඩ සේරම කරන්නෙත් එයයි. , රසිකයි, අංජලියි නම් සැපට ඉන්නවා. සමනලී කල්පනා කරමින් ම දහම් පාසල් ගියා. පූජාවෙන් පස්සෙ දහම් පාසල පටන් ගත්තා.**

සිස්ටර් මේරි දේව අම්මා ගැන හරිම ලස්සනට විස්තර කෙරුවා. ඒත් පුංචි සමනලීට කඳුලු සඟවා ගන්න බැරිඋනා. උදේ සිද්ධියෙන් හරිම කම්පාවෙන් හිටියේ සිස්ටර් දැක්කා සමනලීගේ කඳුලු. ඇයි පුතේ අද ඔයාගේ කඳුලු බොහොම සුක්ෂම විදියට සමනලීගෙන් විස්තර දැන ගත්තා. අපේ ගේ ළඟ පුංචි අක්කියෙක් ඉන්නවා. අද පාඩමේ දී මට එයාව මතක් උනා. ඉන්න අපි මොනවා හරි කරමු. ඔයා සද්දනොකර ඉන්න . සිස්ටර් සමනලීට උපදෙස් දුන්නා. සිස්ටර් මේරී එක හවසක ප්‍රධාන මව්තුමිය වෙත ගියා. එන විදිහටම එතුමිය දැනගත්තා මොකක් හරි හොරයක් තියෙනවා කියලා. ඇයි මොකද, මව්තුමිය කණ්නාඩියට උඩින් ඇස් කොනින් බැලුවා. සිස්ටර් මේරීට හින්දැඩිය දැම්මා. මම - මම පොඩ්ඩක් එළියට ගිහින් එන්නද අම්මා. ඇය කවදත් ප්‍රධාන මව්තුමිය ඇමතුවේ එහෙමයි. එළියට යන්න කියන්නේ කාරණේ කියන්න අමාරුද? මව්තුමිය බොහොම බැරෑරුම් හඬින් ඇහුවා. සිස්ටර්ට ඇත්තම කියන්න සිදුවුනා. සමනලි කීව විස්තරය මව්තුමියට කිව්වා. මේක සමනලී හිතෙන් මවා ගත්ත දෙයක්ද එහෙම නැත්නම් ඇත්තටම සිද්ධවෙනවද බලන්න සමනලීගේ ගෙදරට යන්නයි මම අදහස් කෙරුවේ. එහෙම නම් සිස්ටර් මංගලීවත් එක්ක යන්න. හෙට සමනලීවත් මට මුණ ගස්වන්න.



ගෙදරට ආව පුංචි සිස්ටර්ලා දෙන්නාව සමනලීගේ අම්මා බොහෝම ආදරයෙන් පිළිගත්තා. අපි මේ ළඟට ආවා. ඒ ගමන් සමනලීවත් බලලා යන්න ආවා. අපි තේ ටිකක් බොමු අම්මා යෝජනා කළා. අම්මාට තේ හදාගෙන එන්න උනෙත්නෑ මහ හඬින් අල්ලපු ගෙදර අයෝමිට බණින හඬ හැමෝටම ඇහුනා. සමනලීගේ අම්මාගේ මුහුනේ සතුට තේ පිළිග න්වන කොට තිබුනේ නෑ. අනේ සිස්ටර් හැම තිස්සේම ඔහොමයි. අපිත් අයෝමි ගැන හරි දුකෙන් ඉන්නේ ලලිතා අපිට හරි හොඳයි ලලිතා කියන්නේ අයෝමිගේ නැන්ද. ඒත් මේ දරුවාට සලකන විදිහ නම් අන්තිම නරකයි.

දින දෙක තුනකින් අයෝමී ඉන්න නිවසට ලොකු ස්වාමිත්, මව් තුමියත්, ගමේ විදුහල්පති තුමාත් පල්ලියේ වැඩිහිටි සිස්ටර් මාරි ප්‍රමුඛ තරුණ සමිතියේ කීපදෙනෙකුත් පැමිණුනා. සුලු පිළිසඳරකින් පස්සේ පුජක තුමන් අයෝමි ගැන ඇසුවා. අයෝමිගේ දෙමාපියන් හදිසි අනතුරකින් මිය ගිහින් අසරණ අයෝමිව බාර ගන්න උනේ රසිකගේ තාත්තට තාත්තා ගේ රැකියාවෙන් යැපුණු රසිකගේ පවුලට දැනුනේ අයෝමීව ලොකු බරක් විදිහට රසිකගේ අම්මා ලලිතා කඳුළු වගුරුවමින් කීවා. ඇය පිළිගත්තා අයෝමිට කළේ බරපතළ වරදක් බව. මුලින්ම ම සිදුකළේ රසිකගේ අම්මා තාත්තා ඇතුළු පවුලේ සැමගේ සිත් පුනරුත්ථාපනය කරන එක. ඒ අයට අවබෝධ කොට දුන්නා මේ අනතුර හෙට ඔබේ පවුලට සිදුවිය හැකි බව, අනපේක්ෂිත අවස්ථාවක ඔවුන් ගේ පවුලට කඩා වැදුණු අයෝමි අවාසනාවන්ත දැරියක් නොව ඇය අනතුරින් මිය නොගොස් ජීවත් වීමට මහත් වාසනාවක් නොවේද යන හැඟීම ඔවුන් වෙත ජනිත කළා. ඔවුන් තුළ ඇඳී තිබු නොපහන් බව දුරුකොට පවුල තුළ සැනසීම , සතුට ඇති කළා. විදුහල් පති තුමා කැමති වුනා.අයෝමිව විදුහලට ඇතුල්කර ගැනීමට. සිස්ටර් මාරි කැමති උනා පාසල් නොගොස් අධ්‍යාපනය අඩාල වී සිටි අයෝමී ගේ අධ්‍යාපන කටයුතු වලට උදව් කිරීමට. මුලින් අයෝමි ටිකක් කම්මැලි උනත් සිස්ටර් මාරී ගේ බලවත් පරිශ්‍රමය නිසා ඇය ඉගෙනීමෙහි නිරත උනා. ඔයා දැන් විශ්ව විද්‍යාලයේ පන්ති වලට යන්නේ නැද්ද? සිස්ටර් මංගලී ඒ කියන්නේ සිස්ටර් මාරිගේ හොඳම යෙහෙළිය විමසුවා. යන්න ඕනේ අතපසු උන නෝට්ස් මම දෙන්නම්. එන්න සිස්ටර් මංගලි කීවා. ලබන සතියේ කැම්පස් යනවා ඇය හිතුවා. දහම් පාසලට ආපු සමනලී ගේ මුහුන ආයෙත් නරකයි. සිස්ටර් මාරී සමනලීගෙන් ඇහුවා. ඔව් ඉතින් දැන් ඔයාට අලුත් යාළුවෝ ඉන්නවනේ. සිස්ටර් මාරීට තේරුණා මොකක් ගැනද සමනලී කියන්නේ කියලා. පුංචි හිතට ඊර්ෂ්‍යාව ඇවිත් ඉතින් හවසට ඔයත් එන්නකෝ මේ වදන් කන වැදුණු පන්තියෙම ළමයි අපිත් එනවා අපිත් එනවා කියමින් සිස්ටර් මාරි වටේ රොක්වුනා.

එදයින් පස්සේ හවස පොඩි උන් සේරම සිස්ටර් මාරී ගාව සින්දු කියනවා. සෙල්ලම් කරනවා, විතරක් නෙමේ සිස්ටර් මාරි ඒ අයගේ අධ්‍යාපන කටයුතු වලටත් උදව් කළා. අන්තිමට ගමේ කව්රුත් පුංචි දරුවන්ගේ මේ සුරංගනා ලෝකයට නමක් දැම්මා සමනල අසපුව කියලා. අයෝමි පහවසර ශිෂ්‍යත්ව විභාගයෙන් ඉතා උසස් අන්දමින් සමත් උනා. දිවයිනේ වැඩිම ලකුණු ගත් දස දෙනා අතර අයෝමි හිටියා. අයෝමි විතරක් නෙමේ මෙවර විභාගයට පෙනී සිටි ළමුන් ගණනාවක් ඉහලින් සමත් උනා. ගමේ හැමෝම කීවේ. සමනළ අසපුවේ සිස්ටර් මාරි ගේ මග පෙන්වීම නිසයි මේ ජයග්‍රහණය අද අපට ලැබුනේ කියලා.

දේවස්ථානයේ තරුණ සමිතිය ඒ වෙනුවෙන් උත්සවයක් සංවිධානය කළා. අවසානයේ ත්‍යාග ප්‍රදානෝත්සවය. අයෝමි ගේ ජයග්‍රහණයෙන් පස්සේ සිස්ටර් මාරි හිතුවා දැන් මගේ වැඩ කටයුතු අවසන් දැන් මට පුලුවන් ආයෙත් කැම්පස් යන්න. තමන්ගේ අතට පතිත වුනු වතුර බිංදු කිහිපයක් නිසා සිස්ටර් මේරි සිතුවිල්ලෙන් මිදුනා. තමාටත් නොදැනි සමනලි ඇවිත්. අයෝමි වේදිකාවේ තෑගි ලබනවා. සමනලී ගේ දැසින් කඩා හැලුන සතුටු කඳුලු තමා සිස්ටර් ගේ අත මත පතිත උනේ. උස්ස ගන්න බැරි තරම් තෑගි ගොන්නකුත් උස්සාගෙන අයෝමි ඔවුන් වෙතට එනවා. සුරතේ මාපටඇඟිල්ල කෙලින් ඔසවාගෙන අනෙක් ඇඟිලි හකුළුවා ගෙන නියමයි නියමයි අක්කී, නියමයි. සමනලී කෑගසනවා. අයෝමිවත් සමනලීවත් දැතින් තුරුළුකරගෙන මීට මොහොතකට පෙර සිස්ටර් මේරී ගත් තීරණය වෙනස් කළා. නෑ මම විශ්ව විද්‍යාලයට නෙමේ මම මේ ළමයින් වෙනුවෙන්ම කැප වෙනවා. උත්සව ශාලාවේ දේව මෑණියන් ගේ සුරුවම ඉදිරියේ දැල්වුනු පහනේ ආලෝකය වැඩි උනාවගේ සිස්ටර් මේරිට දැනුනා. ඇය තමාගේ තුරුලේ සිටි සමනලීටත් අයෝමිටත් සුරත දිගුකර සුරුවම පෙන්නුවා. දේව මෑණියෝ හිනා වෙනවා. ඔවුන් තිදෙනාගේ මුවින් එකවර පිටඋනා.

**ඈන් ප්‍රියමාලි හෙට්ටිආරච්චි (ආචාරිනි)**
ශාන්ත ජෝශප් විද්‍යාලය
මරදාන

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## උත්තම පූජක යාච්ඤාව

**★උත්තම පූජක යාච්ඤාවේ ප්‍රධාන කොටස් ලියා දක්වන්න.**

- ජේසුස් වහන්සේ තමන් වෙනුවෙන් දෙව්පියාට තුති දීම ජොහාන් 17/1-5
- ජේසුස් වහන්සේ තෝරාගත් ශ්‍රාවකයින් වෙනුවෙන් යැදීම ජොහාන් 17/6-19
- ලෝකයා වෙනුවෙන් යාච්ඤා කිරීම ජොහාන් 17/20-26
- ශුද්ධවූ සභාව වෙනුවෙන් යාච්ඤා කිරීම

**★ උත්තම පූජක යාච්ඤාව හඳුන්වන වෙනත් නමක් ලියන්න.** • ශ්‍රාවකයින් සඳහා යැදුම

**යාච්ඤාව සහ නව ගිවිසුමේ වෙනත් චරිත**

**★ නව ගිවිසුමේ එන ආදර්ශමත් ප්‍රශංසාවේ යැදුමක් නම් කරන්න.** • මරිය තුමියගේ උදාන ගීය ලූක් 1/46-55

**★ මරිය තුමියගේ උදාන ගීය තුළින් මතුවන ප්‍රධාන අදහස් පහක් ලියන්න.**

- සමිඳාණන් වහන්සේ සිය දාසියගේ (මරියතුමියගේ ) දීනතාව කුළුණුපාමින් සැලකීම
- හැම පරපුරක්ම මරිය තුමියට භාග්‍යවන්ති යැයි පැවසීම
- පරාක්‍රමයාණෝ මරියෝත්තමාවන් වෙනුවෙන් මහත් දේ කළ සේක.
- සමිඳාණන් වහන්සේගේ දහම සිය බැතිමතුන් කෙරෙහි පරපුරෙන් පරපුරට පැතිරීම
- සමිඳාණන් වහන්සේ මහ නරපතීන් සිය සිහසුන්වලින් පහත හෙළා දීනයන් ඉහළ නංවා උසස් කිරීම

**★ ලූක් සුබාරංචිය ඇසුරු කරගෙන මාංශගත වීමේ අභිරහස් සිහි කිරීමට නිර්මාණය කළ යැදුම කුමක්ද?**

- තුන් කාල ආරාධනාව

**★ නමෝ මරිය යැදුමේ ප්‍රධාන කොටස් තුන නම් කරන්න.**

- ග්‍රාබියෙල් දූතයා මංගලම් කී වචන ලූක් 1/28
- එළිසබෙත් තුමිය මරිය තුමියට ආචාර කළ වචන ලූක් 1/42
- සභාව එක් කළ කොටස

**ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**

**★ මුල් සභාවේ යාච්ඤාවේ ආදර්ශ කිහිපයක් නම් කරන්න.**

- මරිය තුමිය, උන්වහන්සේගේ සහෝදරයන් සමග නොකඩවා යාච්ඤාවේ නිරත වීම (ක්‍රියා 1/14)
- බර්ණබස් හා සාවුල් ධර්මදූත සේවයට යැවීමට පෙර අපෝස්තුළුවරු ඔවුන් පිට අත තබා යාච්ඤා කිරීම (ක්‍රියා 13/3)

**★ ශුද්ධවූ පාවුළු තුමාට අනුව යාච්ඤාව යනු කුමක්ද?** • යාච්ඤාව යනු ශුද්ධාත්ම දීමනාවකි.

රෝම 8/26 ට අනුව

*"යාච්ඤාව කළ යුත්තේ කෙසේ දැයි අපි නොදනිමු. එහෙත්*
*ශුද්ධාත්මයාණන් වහන්සේම වචනවලින් කිව නොහැකි අපේ සුසුම්ලෑම්වලදී*
*දෙවියන් වහන්සේ වෙත අප වෙනුවෙන් අයදින සේක."*

(පසුගිය ලිපිය හා සබැඳේ)

# පාතිමා හි දර්ශනයන්

### තෙවන දර්ශනය

ජුලි 13 වන දින ද පෙර සේම එම ස්ථානයේදීම සගපුර සිට පැමිණි උත්තමාව දරු තිදෙනාට දර්ශනය වූවාය. මෙදින එම ස්ථානයට හාර දහසක පමණ ජනතාවක් එක් රැස්ව සිටියාහ. මෙහිදී ලූසියා එතුමියට මෙසේ ප්‍රකාශ කළාය. ''මම කැමතියි ඔබ කවුද කියා අසන්නට. ඔබ මෙහි ප්‍රාතිහාර්යයන් කරන්නේ නම් සියලු දෙනාම දැන ගන්නවා ඔබ අපට පෙනී තිබෙනවා කියා'' එවිට එම දර්ශනය පැවසුවේ ''ඔබ සෑම මාසයකම මෙහි පැමිණිය යුතුයි. මා කවුද කියාත් මට ඕනෑ කුමක්ද කියාත් ඔක්තෝබරයේදී මම ඔබට කියන්නෙමි. එවිට මම ප්‍රාතිහාර්යයක් - පුදුම දෙයක් සිදු කරන්නෙමි. එවිට සියලු දෙනාම විශ්වාස කරනු ඇත'' යනුවෙනි.

එතුමිය මෙහිදි ඔවුනට පොළොව යට වූ විශාල ගිනි සාගරයක් දර්ශනය වන්නට සැලැස්සුවාය. එහි යක්ෂයෝ හා මිනිස් ආත්මයෝ වූහ. එම ආත්මයන් එහි අතිශය දුක් වේදනා විඳිමින් සිටින අයුරු ඔවුනට දැක ගත හැකි විය. එම දර්ශනයෙන් අධික ත්‍රාසයට පත් වූ මේ දරුවෝ එතුමිය දෙස නෙත් යොමු කළහ. එවිට එතුමිය ඔවුනට පැවසුයේ අසරණ පවුකරුවන් යන නිරය ඔවුන් දුටු බවත්, ඒ අය ගළවා ගැනීමට දෙවියන් වහන්සේගේ කැමැත්ත වනුයේ ලෝකය තුළ එතුමියගේ නිර්මල හෘදයට භක්තිය ඇති කිරීම බවත්, එතුමිය කී දේ කළොත් බොහෝ ආත්ම ගැලවී සාමය ඇති වී, යුද්ධය නිමා වන බවත් ය. තවද රුසියාව පිළිබඳව හා දෙවන ලෝක යුද්ධය පිළිබඳවත් එතුමිය විසින් අනතුරු අඟවන ලදී.

### සිව් වන දර්ශනය

අගෝස්තු 13 වන දින වන විට පළාතේ ආණ්ඩුකාරයා විසින් ළමුන් තිදෙනා පැහැර ගෙන ගොස් සිරගත කොට තිබූ නිසා ඔවුනට නියමිත පරිදි එම ස්ථානයට යාමට නොහැකි වූ මුත් පහළොස් දහසක පමණ ජන සමූහයක් එහි පැමිණ සිටියහ. සාමාන්‍ය යෙන් සෑම දර්ශන යකටම පෙර ගස මුදුනේ දිස්වූ දීප්තිමත් වළාකුළ මෙදින ද ජනතාවට දැක ගත හැකි විය. සිරභාරයෙන් නිදහස ලැබීමෙන් අනතුරුව එතුමිය අගෝස්තු 19 වන දින වැලින්හොස් හිදී ළමුන්ට දර්ශණය වූවාය.

### පස්වැනි දර්ශනය

සැප්තැම්බර් 13 වන දින අඩුම වශයෙන් තිස් දහසකවත් ජනතාවක් එහි එක් රොක් වී සිටියදී ලූසියා ඔවුනට දණ ගසාගෙන ජපමාලය උච්චාරණය කරන්නැයි කීවාය. මෙහි පැමිණීම පැවදිවරුන්ට තහනම් කර තිබිණි. ලෙයිරියාවේ විකාරි ජනරාල් තුමා ද තවත් පූජාප්‍රසාදී තුමෙක්ද රහසින් බලා සිටියහ. මොන්සිඤ්ඤෝර් ජෝන් ක්වාරෙස්මා විකාරි ජනරාල් තුමා ඒ ගැන පවසනුයේ මෙසේය. ''මාගේ පුදුමයට මෙන් සෙමින් සෙමින් හා තේජස් සම්පන්නව නැගෙනහිර සිට බටහිරට ගුවනින් දිළිසෙන ගෝලයක් ළඟා විය'' අනෙක් පියතුමාද එලෙසම එය දුටු බව පැවසේ.

### අවසාන දර්ශනය හා මහා ප්‍රාතිහාර්යය.

ඔක්තෝබර් 13 වන දින ලක්ෂයකට නොඅඩු ජනතාවක් එම ස්ථානයේ රැස්වූ බව පෘතුගාලයේ කොයිම්බ්‍රා විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයකුගේ ගණනය කිරීමකට අනුව වාර්තා විය. එදින තද සීතල වැසි දිනයක් මෙන්ම සෑම තැනම පාහේ අඳුරු සහිත විය. කුඩ දිග හැරගෙන සිටි ජනතාවට කුඩ හකුලන ලෙස ලූසී අණ කළ විට සියල්ලෝම ඊට එකඟ වූහ. මඳ වේලාවකින් වර්ෂාව නතර වී විදුලි කෙටීම් ඇති විය. ඉන්පසු ශ්වේත වර්ණ දීප්තිමත් වළාකුළ පැමිණියේය.

එහිදී ළමුන්ට දර්ශනය වූ කාන්තාව මෙසේ පැවසුවාය. ''මම වනාහි ජපමාලයේ ස්වාමිදුව වෙමි. මා පැමිණ සිටිනුයේ පාපවලට පසුතැවිලි වන ලෙස මනුෂ්‍යයනට අනතුරු අඟවන්නටත්, අප ස්වාමින් වහන්සේට විරුද්ධව තව තවත් පව් නොකරන ලෙස අවවාද කිරීමටත්ය. එසේම දිනපතා ජපමාලය උච්චාරණය කරන ලෙස දැන්වීමටත්ය'' ඕ තොමෝ තව දුරටත් මෙසේ ද පැවසුවාය. ''මේ ස්ථානයෙහි මාගේ නාමයට දෙව් මැදුරක් ඉදි කරනු ලැබීම මාගේ ආශාවය'' එතුමිය නික්ම යමින් සිටියදී වර්ෂාව නතර වී වළාකුළු පහව ගොස් තිබිණි. ජනතාවගේ නෙත් අහස වෙත යොමු විය. ඉර සාමාන්‍ය ප්‍රභාවෙන් නොවීය. එය රිදී තැටියක් මෙන් විය. එතුමිය කලින් දන්වා තිබූ මහා ප්‍රාතිහාර්යය සිදු වීම ඇරඹෙමින් තිබිණි. හිරු මඬල වියළි මීදුමකින් ආවරණය වී නිසල වී වෙව්ලුම් කන විලාශයෙන් එහාට මෙහාට සෙලවුන අතර, නිල් ,රතු, කොළ, හා දම් වර්ණයන්ගෙන් යුත් රැස් දහරා විහිදුවමින් භ්‍රමණය වන්නට පටන් ගති. විනාඩි තුනකට පමණ පසු එය නැවතී , යළිත් ඇති වී , නැවතත් නතර වී තෙවන වරටත් භ්‍රමණය වන්නට වූයේය. මෙය විනාඩි 12 ක් පමණ පැවතිණ.

තුන්වන භ්‍රමණය අවසානයේදී හිරු දිස්වූයේ අහසින් කඩා වැටෙමින්, බියෙන් තැති ගෙන එකම හඬින් කෑ ගසමින් හඬමින් සිටි මහත් ජන සමූහයා මතට ඇද වැටෙන්නට එන්නාක් මෙනි. මඩ සහිත පොළොවේ දණින් වැටී සියල්ලෝම යාච්ඤා කළෝය. ''ආදර දෙවියනී, මගේ පාපයන් තුළ නැසී යාමට මට ඉඩ නොදුන මැනව.'' ශුද්ධවූ කන්‍යාවෙනි, අප රැක ගත මැනව.'' කතෝලික මෙන්ම අන්‍යාගමිකයින්ට ද සැතපුම් විස්සක් පමණ ඈත ගම් නියම්ගම් වලට ද මේ අද්භූත සිද්ධිය දැක ගත හැකි වූ බවත් හිරුගේ අසාමාන්‍ය ක්‍රියාකාරීත්වය විනාඩි 12 ක් පමණ පැවති බවත් එකල පෘතුගාල පුවත්පත් මගින් වාර්තා කර තිබිණි.මේ සිදුවීම අතරතුරදී එතුමිය දරුවනට වූ පොරොන්දුවක් ඉටු කරමින් දර්ශන තුනක් දැක ගැනීමට සැලැස්සුවාය. මුලින්ම ශුද්ධවූ පවුල ද, ඉන්පසු වික්ෂෝප මාතාව ලෙස දෙව් පුතුන් සමඟද තෙවනුව දුඹුරු වර්ණ ඇඳුමින් යුතුව දුඹුරු බෙන්තිඤ්ඤය අතින් ගෙන කාර්මෙල්හි අප ස්වාමිදුව ලෙසත් ස්වර්ගයේ හා මිහිපිට රාජිණිය ලෙස කිරුළු දරා සිය බිළිඳු පුතු දණහිස මත තබා ගෙන එතුමිය දර්ශනය වූවාය.

භාග්‍යවත් මාතාව පොරොන්දු වී තිබූ ලෙස ෆ්‍රැන්සිස්කෝ හා ජසින්තා ඉතා ඉක්මණින් ස්වර්ගයේදී එතුමිය සමග එක් වූහ.

ඩී.ඩී. මේරි රීටා - දහම් ගුරු
ශු. ස්නාවක ජුවාම් දහම් පාසල - නාගොඩ , කඳන



## කොළඹ අගරදගුරු පදවිය



## පළමු වරට දිව බොදුන් ලැබීම

රද්දොලුගම ලූර්දු මාතා දහම් පාසලේ ළමෝ 20 දෙනෙකු රද්දොලුගම ලූර්දු මාතා දෙව් මැදුරේදී ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. ඉන් අනතුරුව , මීසම් සේවක ගරු ප්‍රසාද් පෙරේරා පියතුමන් සහ දහම් ගුරුවර ගුරුවරියන් ළමා ප්‍රදිපය සඳහා සමූහ ඡායාරූපයකට එක්වූ අවස්ථාව මෙහි දැක්වේ.

**- රන්ජිත් ලොකුපෝතාගම**

## මහනුවර පදවිය



ගැටඹේ ශාන්ත මරියා දේවස්ථානයේ දරු දැරියෝ 20 දෙනෙකු පසුගියදා පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ. මීසම් සේවක ගරු සුදත් රෝහණ පෙරේරා පියතුමන් සමග ළමුන් සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු

## හලාවත පදවිය



පුත්තලම ශාන්ත මරියා දේවස්ථානයට අයත් දරු දැරියෝ 57 දෙනෙකු පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගත්හ. මීසම් සේවක ගරු ඇන්ටන් ජයරාසන් මීසම් සහයක ගරු ප්‍රගීත් නිමන්ත, ශ්‍රීනිත් ප්‍රනිල්ක යන පියතුමන්ලා ඇතුළු දරුවන් පුරුදු පුහුණු කළ ගරු රොස්ලින් ප්‍රනාන්දු පැවදි සොයුරිය හා දහම් ගුරුවරිය සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු

**- ශ්‍රියානි ෆර්ඩිනැන්ඩු**

# දරුවන් ජපමාලය හා දේව මාතාවන් වෙත නැඹුරු කිරීම කාලීන අවශ්‍යතාවයක්

## ගරු අයිවන් පීටර් ප්‍රනාන්දු පියතුමා මාරවිල ජපමාල රැළියේදී පවසයි



මාරවිල මීසමේ දහම් පාසල් දරු දැරියන් සඳහා ජපමාල රැළියක් පසුගිය දින මාරවිල කානික්ක මාතා දෙව්මැදුරේදී පවත්වනු ලැබීය. මීසමේ දහම් පාසල් දරුවන් දහසකට වැඩි පිරිසක් මීට සහභාගි වූහ.

මීසම් සහායක ගරු දිලංක නිර්මාන් පියතුමා සමග රැළිය සංවිධානය කළ මාරවිල මීසම් සේවක ගරු අයිවන් පීටර් ප්‍රනාන්දු පියතුමා සඳහන් කළේ දරුවන් ජපමාලය හා දේවමාතාවන් වෙත නැඹුරු කරවීම කාලීන අවශ්‍යතාවයක් බවය.

ජපමාලය අර්ථාන්විතව උච්චාරණය කිරීම පිළිබඳ පුහුණුවක් මෙහිදි දරුවන්ට ලබා දෙනු ලැබීය. නිලූෂා සුදර්ශනි මෙනෙවියගේ අනුග්‍රහයෙන් ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩ සටහනක් අනුසාරයෙන් ශුද්ධවූ දේශය පිළිබඳ දැනුමක් දරුවන්ට ලබාදීමද සිදුවිය. මීසමේ දහම් ගුරු භවතුන්ගේ හා බාහිර සම්පත් දායක පිරිසකගේ සහය රැළිය සංවිධානය කිරීමේ ලා ලැබී තිබුනි.

**ලිඩ්වින් කිරිඇල්ලදෙණිය**

# මා දුටු සිහිනයක්

පුරුදු පරිදි කෑම කා රාත්‍රී 10 ට පමණ මම නින්දට ගියෙමි. මොහොතකින් මාව නිදි දෙව්දුව වැළඳ ගත්තාය. ලොකු අම්මාගේ ගෙදර අයත්, අපේ ගෙදර අය සහ නංගිලා තුන්දෙනාත් සමඟ අපි මුහුදු වෙරළට ගියෙමු. නංගිලා තුන්දෙනා සමග මමද මුහුදු වෙරළේ වැලි මාලිගා තැනුවෙමු. ගත වුයේ නිමේෂයකි. මුහුදේ රැලි අතර ආ ලොකු රැල්ලකට සෙනුරි නංගි ගසාගෙන යනවා මම දුටුවෙමි. එවිට මම ''අයියෝ'' කියා කෑගැසුවෙමි. එවිට අම්මා මා ළඟට දුව ඇවිත් මා කෑගැසුවේ ඇයි දැයි කියා ඇසුවාය. මම අම්මාට මුළු විස්තරයම කීවෙමි. එවිට අම්මා , දුව දැකලා තියෙන්නේ හීනයක්නේ, දැන් ජේසුට යාච්ඤා කර නිදාග න්න යැයි කියමින් මගේ ඔළුව අතගෑවාය.

**සාරංගි පෙරේරා**
**සා. මරියා දේවස්ථානය - මහරගම**



**මාසික සිතිවිල්ල**
“ඔක්තෝබර් මාසය”
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

මාසික
සිතිවිල්ල



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 75

## නැවත මතක් කර ගන්න

16. My friend lives **in** Dutugamunu mawatha, and I live **in** st. Anne's street.
(මයි ෆ්‍රෙන්ඩ් ලිව්ස් ඉන් දුටුගැමුණු මාවත ඇන්ඩ් අයිලිව් ඉන් සෙන්ඩ් ඇන්ඩ් ස්ට්‍රීට්) මගේ මිතුරා ඉන්නෙ දුටුගැමුණු මාවතේ. මම ඉන්නෙ ශා. ආනා පාරේ.

17. Today there are many stars **in** the sky.
ටුඩේ දෙය(ර්) ආ මෙනි ස්ට(ර්)ස් ඉන් ද ස්කයි.)
අද අහසේ තරු ගොඩයි.

18. There are many countries **in** the world.
(දෙයා(ර්) ආ(ර්) මෙනි කන්ට්‍රීස් ඉන් ද වර්ල්ඩ්)
ලෝකයේ රටවල් බොහොමයක් තියෙනවා.

19. Nirmala's photo was there **in** today's newspaper.
(නිර්මලාස් ෆොටෝ වොස් දෙයා(ර්) ඉන් ටුඩේස් නිව්ස් පේපර්)
අද පත්තරේ නිර්මලාගෙ ඡායාරූපය තිබුණා.

20. There are five children **in** this picture.
(දෙයා(ර්) ආ(ර්) ෆයිව් චිල්ඩ්‍රන් ඉන් දිස් පික්ච(ර්)
මේ පින්තූරෙ ළමයි පස් දෙනෙක් ඉන්නවා.

21. Since it was raining, I came **in** a taxi.
(සින්ස් ඉට් වෝස් රේනිං, අයි කේම් ඉන් අ ටැක්සි)
වර්ෂාව නිසා මම ආවේ ටැක්සියක.

22. **In** the middle of the speech, he started to cough.
(ඉන් ද මිඩ්ල් ඔෆ් ද ස්පීච් හී ස්ටා(ර්)ටඩ් ටු කොෆ්.)
කතාව මැද දී ඔහු කහින්න පටන් ගත්තා.

23. Sunitha lives **in** London.
(සුනීතා ලිව්ස් ඉන් ලන්ඩන්)
සුනීතා ජීවත්වෙන්නෙ ලන්ඩන්වල.

24. Please come **in** a row.
(ප්ලීස් කම් ඉන් අ රෝ)
කරුණාකර පෝලිමේ එන්න.

25. When Peter goes to a cinema, he likes to sit **in** the front row.
(වෙන් පීටර් ගෝස් ටු අ සිනමා, හී ලයික්ස් ටු සිට් ඉන් ද ෆ්‍රන්ට් රෝ පීටර් සිනමාහලකට ගියාම, ඉස්සරහම පේලියේ ඉන්න ආසයි.

මතක තබා ගන්න සිනමා ශාලාවක්, බිල්ඩිමක්, මිනිසුන් සමූහයක් වගේ තැනකදී යෙදෙන්නේ **in** නෙමෙ **at.**

We sat at the back - අපි පිටුපසින් වාඩිවුණා
at the front of the hall - ශාලාවේ ඉදිරිපස හරියෙන්
at the back of a house - ගේ පිටුපසට වෙන්න

නමුත් පේලියක් ගැන කියද්දී ඉහතින් සඳහන් විදිහට in the front row කිව යුතුයි.

**In** the back of the car. කාරෙකේ පිටුපස
There is a mango tree **at the back of our house**
(දෙයා(ර්) ඉස් අ මැන්ගෝ ට්‍රී ඇට් ද බැක් ඔෆ් අව(ර්) හවුස්.
අපේ ගේ පිටුපසට වෙන්න අඹ ගහක් තියෙනවා.

There is a mango tree **in the back yard.**
(දෙයා(ර්) ඉස් අ මැන්ගෝ ට්‍රී ඉන් ද බැක් යාර්ඩ්.)
පිටිපස්සෙ වත්ත පහළ අඹ ගහක් තියෙනවා.

I live **in Kandy.** - (අයි ලිව් ඉන් කැන්ඩි)
මම ඉන්නෙ මහනුවර.

Sunil lives **at Polgahawela.** (සුනිල් ලිව්ස් ඇට් පොල්ගහවෙල)සුනිල් ඉන්නෙ පොල්ගහවෙල.

මෙහිදී සාමාන්‍යයෙන් විශාල නගරයක් හෝ ස්ථානයක් නම් **in** යෙදෙන අතර, ඊට සාපේක්ෂ කුඩා නගරයක් හෝ ස්ථානයක් නම් **at** යෙදේ.

## පඬිවත්තේ දහම් ළමෝ ගායනයෙන් දස්කම් පාති...



ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව පසුගිය නත්තල වෙනුවෙන් මෙහෙය වූ තරගාවලියේ ජයග්‍රාහකයින්ට සම්මාන හා සහතික පත් බෙදා දීම පසුගියදා ජාතික පදනම් ආයතනයේදී පැවැත්වුණි. 5,6,7, ශ්‍රේණි සඳහා පැවැත්වූ ගායනා තරගයෙන් දෙවැනි ස්ථානය දිනා ගැනීමට පඬිවත්ත මීසම සමත් විය. පඬිවත්ත මීසම් සේවක ගරු ඇල්වින් පීටර් ප්‍රනාන්දු පියතුමන්ගේ මඟ පෙන්වීම යටතේ මොවුන් ඉදිරිපත් වූහ.

ජුඩ් ෂැනන් ලූෂන් (නායක), ඩෙවිමිනි වනිග සේකර, හිරුෂි කොඩිතුවක්කු, නතාලි ද සිල්වා, ෂනුකි කොඩිතුවක්කු, චතුරිකා ප්‍රනාන්දු, කෙවින් ජෝර්ජ් යන ජයග්‍රාහී ළමෝ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් සමඟ ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටියහ. **එම්.ජේ. ලූෂන්**

## මරදාන සා. ජෝශප් විදුහල් බයිබල් තරගාවලිය.

**( ✍ ස්ටැනිස්ලස් පයස් විසිනි)**

''දේව වචනයේ වර්ෂය'' අරුත් ගන්වමින් කොළඹ සාන්ත ජෝශප් විදුහල් බයිබල් අධ්‍යාපන සංගමය හත්වන වරටත් සංවිධානය කළ අන්තර් පාඨශාලයිය වාර්ෂික බයිබල් දැනුම මිනුම තරගාවලිය කොළඹ සහයක රදගුරු අති උතුම් එම්මැනුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ඉකුත්දා විදුහල් ශාලාවේදී පැවැත්විනි. මෙවර තරගාවලියට කණිෂ්ට, අන්තර් මධ්‍යම හා ජ්‍යෙෂ්ඨ යන අංශ තුනකින් කණ්ඩායම් 58 ක් සහභාගිවුණි. අදාල තරග ප්‍රතිඵල මෙසේය.

### කනිෂ්ඨ අංශය

ශූරතාවය - ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය - බම්බලපිටිය

අනුශූරතාවය - ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය - කළුතර

තෙවන ස්ථානය - ද මැසනොද් විදුහල - කඳාන

### අන්තර් මධ්‍යම අංශය

ශූරතාවය - යහපත් එඬේරාගේ කන්‍යාරාමය - කොටහේන

අනුශූරතාවය - ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය - බම්බලපිටිය

තෙවන ස්ථානය - සියළු සාන්තුවරයන්ගේ බාළිකා විදුහල - බොරැල්ල

### ජ්‍යෙෂ්ඨ අංශය

ශූරතාවය - ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය - කොළඹ

අනුශූරතාවය - ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය - බම්බලපිටිය

තෙවන ස්ථානය - ලොයලා විදුහල - මීගමුව



**කනිෂ්ඨ අංශයේ ශූරතාවය දිනූ කණ්ඩායම**



**ජ්‍යෙෂ්ඨ අංශයේ ශූරතාවය දිනූ කණ්ඩායම**

සේයා - අජිත් පෙරේරා ශ්‍රීවින්ද ජයවර්ධන

## බුළුපිටිය දහම් ළමුන්ට ලේඛකත්ව පුහුණු වැඩමුළුවක්

ලෝක ළමා දිනය වෙනුවෙන් කුරුණෑගල රදගුරු වසමේ බුළුපිටිය දේවස්ථානයේ ශු. කාර්මෙල් මාතා දහම් පාසලේ දරු දැරියන්ගේ ලේඛක හැකියා ඔප්නැංවීම් අරමුණින් ලේඛක වැඩමුළුවක් පසුගියදා දේවස්ථාන ශාලාවේදී පැවැත්විණි.

මෙම වැඩමුළුව මෙහෙයවූයේ ඥානාර්ථ ප්‍රදීපය හා ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. බුළුපිටිය මීසම් සේවක ගරු ආනන්ද වීරකෝන් පූජා ප්‍රසාදින් වහන්සේගේ උපදෙස් මත දේවස්ථාන දහම් ගුරු මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී. මෙදින ළමුන්ට සංග්‍රහයක් ලබාදුන් අතර මේ සඳහා දේවස්ථානයේ වැඩිහිටි කිහිපදෙනකුගේ මූල්‍යමය දායකත්වය ලැබිණි.

මෙයට එක්වූ ළමුන්ට ලේඛක අභ්‍යාසයක් ලබා දුන් අතර ඉන් සාර්ථක නිර්මාණ ඉදිරිපත් කළ ළමුන් සඳහා දේශක මහතා විසින් ජපමාල පරිත්‍යාග කිරීමද විශේෂත්වයකි.

**නිරෝෂා කාමෙල් තිරිමාන්න - ආචාර්ය මඩුල්ල**

ශු. කාර්මෙල් මාතා දහම් පාසල - බුළුපිටිය



**දිව්‍ය හෘදයේ ජේසුනි**

**භාග්‍ය සල්ගාදු**
05 ශ්‍රේණිය,
සා. සෙබස්තියන් විදුහල - මොරටුව

**පුංචි අපේ චිත්‍ර පිටුව**

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**අලි රංචුවක්**

**උදාර චන්දිම වීරරත්න**
06 ශ්‍රේණිය
ශාන්ත අන්තෝනි පිරිමි විදුහල
කටුගස්තොට





**අපේ ආදි මව්පියෝ**

**ශ්‍රීකාන්ත් ප්‍රනාන්දු**
08 ශ්‍රේණිය
සා. ජුඩ් විදුහල - කුරණ

**දේව අම්මා**

**මහිෂා අශානි ප්‍රනාන්දු**
07 ශ්‍රේණිය
ශුද්ධවූ පවුලේ බාලිකා මහ විදුහල
වෙන්නප්පුව






**අපගේ ගැලවුම්කරුවාණෝ**

**හිරුණි ඉමාෂා මාරසිංහ**
05 ශ්‍රේණිය
සාන්ත මරියා ප්‍රාථමික බාලිකා විදුහල
හලාවත

**මුව රංචුවක්**

**ඇන්ඩ්‍රියා සුලක්ෂි**
06 ශ්‍රේණිය
සාන්ත බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ - 07



**උදෑසන අසිරිය**

**ස්වේන් දේදුනු ප්‍රශංසා**
01 ශ්‍රේණිය
නිමල මරිය බාලිකා මහ විදුහල
තුඩැල්ල



**මෝසෙස් තුමන් මුහුද දෙබෑ කිරීම**

**ඈන් හිරුණි සකුන්තලා**
07 ශ්‍රේණිය,
ගොන්සාල්වෙස් මහ විදුහල
පමුණුගම



# ශු. කැතරින් ලැබුරේ



සුදුවර චරිතයක් හඳුනාගනිමු

බර්ගන්ඩියේ ධනවත් ගොවි පවුලක උපන් කැතරින් තුමීය , දරුවන් එකොළොස් දෙනෙකු ගෙන් නව වැනියා වූවාය. 1830 ඇය , පැරිසියේ රුයි ද බාක් හි දයාවේ සාන්ත වින්සන් ද පාවුලා නිකායේ අධුනික සොහොයුරියක් වූවාය. ඇයට මෙහිදී ලොව්තුරු දෑ ප්‍රත්‍යක්ෂ වන්නට විය. ආරම්භයේදී ඇයට සත්ප්‍රසාදී සමිඳුන් පියවි ඇසින් දැකගත හැකි වූ අතර ශු. ත්‍රිත්වයේ ඉරුදින ඇයට ක්‍රිස්තු රජාණෝ දර්ශණය වූහ. මින්පසු රුයි ද බාක් දෙව්මැදුරේදී ඇයට දෙව්මව විසින් එළිදරව් කරනලද දෑ ඇගේ ආත්මික පියතුමාගේ මගපෙන්වීම මත ඇය විසින් ලියන ලදී.මින් පළමුවැන්න මැදියම් රැයෙහි සිදුවිණි.

ඇය නිදා සිටිද්දී කුඩා දරුවකු ඇය අවදි කරවා මැනවින් ආලෝකමත්ව තිබූ දෙව්මැදුර වෙත ඇය කැඳවාගෙන යනු ලැබුවාය. එහිදී දෙව් මව් ඇයට දර්ශණය වී පුටුවක වාඩිවී පැය තුනක් පමණ ප්‍රංශයට සිදුවන්නට යන දේ ගැන ඇය සමඟ කථා කළාය.

නොවැම්බර් 2 වන දින දෙව්මව් දෙවන වරටත් දර්ශණය වූ විට, අල්තාරයට ඉහලින් පෙනී සිටියාය. තමා පෙන්නුම් කරන ආකාරයට පදක්කම් සාදන ලෙස ඇය කැතරින් තුමියට කීවාය. එකෙණෙහිම ආණ්ඩුකාර හැඩයෙන් යුත් පදක්කමක් දිස්විණි. එහි මැද දෙව් මව්ගේ රූපය පිළිබිඹු විය.



පොලව දෙසට විහිදෙන ඇගේ අත්වලින් රැස් දහරා විහිදෙන්නට වුයේ ඇගේ පිහිට පතන්නන්ට අත්වන වරප්‍රසාදයන්හි සංකේතයක් ලෙසිනි.

පදක්කමෙහි අනෙක්පස M අකුරද, කුරුසයක් ද කටුවලින් වටවූ ජේසුගේ සිරි හදද, සලකුණු වී තිබුණි, ඒ අප විශ්වාසයේ සත්‍ය සාරාංශයකි.

මෙම පදක්කම තුළ දේව මාතාවන් වහන්සේගේ ප්‍රතිරූපය නිර්මල පිළි සිඳීම තුළින් ඉදිරිපත් කර ඇති අතර පදක්කම වටේට අප කවුරුත් දන්නා සුප්‍රකට යැදුමක් ද අන්තර් ගත කොට ඇත. එම යැදුම වනාහි ''ජන්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳුනා වූ මරියනි, ඔබ වහන්සේගේ පිහිටෝප කාර ඉල්ලා සිටින අප උදෙසා යාච්ඤා කළ මැනව'' යනුයි.

මෙම භක්තිය එදා සිට අද දක්වාම මුළු ලෝකය පුරාවටම ප්‍රචලිත වූ අතර එය පැමිණෙන්නට තිබෙන ප්‍රංශයේ හා යුරෝපීය රටවල් වල යුධමය තත්ත්වයට හා විනාශයන් පිළිබඳව දේව මාතාවන් ප්‍රකාශ කරන ලද අණාවරණයක් විය.

පදක්කම සාදා බෙදාහරින ලදී. පදක්කම පිළිබඳව හාස්කම් , සුවවීම් , සිත්හැරීම් සහ නොයෙකුත් ආත්මික වරප්‍රසාද ගැන වාර්තා ගලා එන්නට වූ අතර ඒ නිසාම එය පුදුම පදක්කම නමින් ප්‍රචලිත වන්නට විය. 1842 දී කැතරින්තුමිය ස්වර් ගස්ත වූවාය. ඉන් වසර 46 කට පසු ද ඇගේ ශරීරය මුළුමනින්ම නොදිරා තිබුණි. ඇගේ අත් පා සහ මුහුණ රෝස පැහැයෙන් යුතුව තිබුණි. බාහු අත් පා සහ ඇස් ඒ කුහර තුළ සවි වී තිබුණි. අද දක්වාම ප්‍රංශයේ රුයි ද බාකි සුවිශාල දේවස්ථානයේ වීදුරු මංජුසාවක එතුමියගේ නොදිරන සිරුර දැකගත හැකිය.

අසේල දසනායක

## ප්‍රහේලිකා අංක 34

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | 2 | ■ | 3 | |
| | ■ | 4 | | | ■ |
| | ■ | | ■ | | ■ |
| ■ | ■ | | ■ | ■ | ■ |
| 5 | | | 6 | ■ | ■ |
| | ■ | ■ | 7 | | |

සැකසුම

තිළිණි
දුතිකා
පෙරේරා

හරහට

1. මෝසෙස්ගේ මරණයෙන් පසු ඊශ්‍රායෙල් ජනතාවගේ නායකයා වශයෙන් පත්වූයේ මොහුය.

3. ක්‍රිස්තුන් වහන්සෙ, මනස්ථාපනය නොවූ නගරවල වැසියන්ට කථා කරමින් ''දේව විනිශ්චය දවසේදී ඔබට වඩා .................... හා සිදොනයට සහනය ලැබෙන්නේ යැයි'' වදාළ සේක මෙහි හිස්තැනට සුදුසු වචනය

4. ක්‍රිස්තුස් වහන්සේ බොහෝ අවස්ථාවල මෙය කඩ කළ බවට විනධරයන් හා පරිසිවරු ක්‍රිස්තුන් වහන්සේට චෝදනා කළෝය

5. ''මගේ වියගහ කරට ගෙන මගෙන් ඉගෙන ගන්න'' එවිට ඔබට ............ ලැබෙනු ඇති'යි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. දොළොස් වසරක් මහලේ රෝගයෙන් පෙළුනු ස්ත්‍රීයක් ක්‍රිස්තුන් වහන්සේගෙන් සුවය ලබාගත්තේ මහත් විශ්වාසයකින් යුතුව මෙය ස්පර්ශ කිරීමෙනි.

පහළට

1. දේව මැණියන්ගේ පියාගේ නම

2. ''මගේ පියාණන් වහන්සේගේ නිවාසයෙහි බොහෝ .......... ඇතැයි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ශු. බයිබලයේ නව ගිවිසුමෙහි ශු. පාවුළු තුමා විසින් යවනු ලැබූ හසුන් පත්වලින් එකකි.

5. තමන්ට විරුද්ධව පව් කරන සහෝදරයාට කමා විය යුත්තේ මෙම වාර ගණන දක්වා පමණ දැයි පේදුරු තුමා ක්‍රිස්තුන් වහන්සේගෙන් ප්‍රශ්න කළේය.

6. යක්ෂයා , ක්‍රිස්තුන් වහන්සේව පරීක්ෂා කරමින් ලෝනයේ සියල් රට රාජ්‍යයන් පෙන්වා මේවා කෙරෙහි මුළු ආදිපත්‍යයද ඒවායේ........ ඉසුරුද ලබා ගැනීමට නම් යක්ෂයාට නමස්කාර කරන ලෙස ඉල්ලීය. මෙහි හිස්තැනට සුදුසු වචනය

(මෙම ප්‍රහේලිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. මතෙව් 11/18, ශු. ලුක් 4,8,9,6 , ශු. ජුවාම් 14,)

## ප්‍රහේලිකා අංක 33

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 මැ | යි | ■ | 2 සි | ර | 3 ස |
| සි | ■ | ■ | තු | ■ | එ |
| 4 වි | 5 ල | ■ | 6 වි | පු | ල |
| 7 ලි | ය | වි | ලි | ■ | ත් |
| ■ | ට | ■ | ■ | 8 ම | ව |
| ■ | ■ | ■ | 9 ද | හ | ය |

## ප්‍රහේලිකා අංක 33 - ජයග්‍රාහකයෝ

- 1 වන ස්ථානය

පියුමි නවෝද්‍යා - 07 ශ්‍රේණිය
ආරෝග්‍යමාතා දහම් පාසල - ගල්මල්පඳුර (කටුනේරිය මීසම)

- 2 වන ස්ථානය

රශ්මි කවින්දි රුදිගු - 04 ශ්‍රේණිය
සාන්ත ජෝශප් දහම් පාසල - පමුණුගම

- 3 වන ස්ථානය

අවිශ්ක ප්‍රමුදිත ප්‍රනාන්දු - 5 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල - තොඩුවාව

### අනුරාධපුර දිස්ත්‍රික් පාසල් බයිබල් දැනුම මිනුම තරගයේ අනුශූරතාව අලගොල්ලෑවට....



ශ්‍රී ලංකා බයිබල් සංගමයේ 200 වන සංවත්සරය නිමිත්තෙන් අනුරාධපුර දිස්ත්‍රික් පාසල් සිසුන් අතර පවත්වන ලද බයිබල් දැනුම මිනුම තරගයේ අනුශූරතාව දිනා ගැනීමට අලගොල්ලෑව ශාන්ත අන්තෝනි මහා විද්‍යාලයේ බයිබල් දැනුම මිනුම කණ්ඩායමට හැකිවිය. ජයග්‍රාහී කණ්ඩායම මෙසේ ළමා ප්‍රදීපය සඳහා සාමූහික ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**රෝෂිනි ලලන්ති,**
ශාන්ත අන්තෝනි දහම් පාසල - අලගොල්ලෑව


රජ කුමාරයයි කිඳුරු කුමාරියයි
කථාව ලියූ ආනන්ද කාලුදේරා
දෙබස්, චිත්‍ර: ඇස්.ඒ.ඩී. සපුආරච්චි
20
කුමාරිට යාලුවව හොඳටම විශ්වාසයි. ඔන්තුකාරියගෙ දුව කියපු දෙයක් කවදාවත් වරද්ද තිබ්බෙ නෑ. කුමාරි ඊට පස්සෙ සියලු දේවල් අමතක කරපු විදිහට සතුටෙන් සිටියා.
දිය කිඳුරියන්ට ඒ ගොල්ලන්ගෙ රාජධානියෙන් පිටතට යන්න අවසර තිබුනට මනුස්සයො ඉන්න පළාතට යන්නූ තහනම් මිනිස්සුන්ට හොරෙන් තමයි ජීවත්වෙන්න ..ඕනි...
ඒ අයගෙ නීති රීතිත් හරිම දරුණුයි.. වැරදි කරල අහුවු.. නොත් කොහොමවත්ම බේරුමක් නෑ.. රජ පවුලෙ අයට උනත් නීතිය නීතිය මයි.. ඒ නිසා තමයි.. කුමාරිටයි මායාකාරිගෙ දුවටයි දඬුවම් කෙරුවෙ.. ඒ නිසයි මේ දෙන්නව සිරකරල කුමාරි ගැන හොයන්න හැම තැනම ඔත්තුකාරයින්ව දැම්මෙ...
යාලුව කියපු විදියට කුමාරිත් කුමාරයව අමතක කරපු විදිහට හොඳට සතුටෙන් ඉන්න බව පෙන්නුවා
රැජිණට දවස ගානෙම කුමාරි ගැන ඔත්තුකාරයන්ගෙන් තොරතුරු ලැබුනා...!
අවසර රැජිණියෙනි
ටික දවසක් යනකොට රැජිණට කුමාරි ගැන සැකය ටික ටික අඩුවුනා...
දැන්නම් කුමාරි හුඟක් සතුටෙන්මයි ..ඉන්නෙ...

හතර වන කොටස

පාළුකරයේ දින හතළිහක් ගත කළ කතාව...

සැකසුම : තිළිණ අලහකෝන්

